# දැන්වීමයි

## කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## පීඨ ශිෂ්‍ය සමිතිවලට නියෝජිතයින් තෝරා පත් කර ගැනීම
## 2020/2021 අධ්‍යයන වර්ෂය

1985 අංක 07 සහ 1988 අංක 26 දරන පනත්වලින් සංශෝධිත පරිදි 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතෙහි 135 ඡේදය හා 112 (3) ඡේදය යටතේ කැලණිය විශ්වවිද්‍යාලයෙහි පාලක සභාව විසින් පනවන ලද 2010 අංක 01 දරන ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාවෙහි 8 (1) ඡේදය ප්‍රකාරව පීඨ ශිෂ්‍ය සමිතිවලට නියෝජිතයින් තෝරා පත් කර ගැනීමට අදාළ නියමයන් පහත දැක්වේ.

**(අ) පීඨ ශිෂ්‍ය සමිතියේ නම**

1. සමාජීය විද්‍යා පීඨ ශිෂ්‍ය සමිතිය
2. වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨ ශිෂ්‍ය සමිතිය
3. විද්‍යා පීඨ ශිෂ්‍ය සමිතිය
4. මානවශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සමිතිය
5. වෛද්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය
6. පරිගණක හා තාක්ෂණ පීඨ ශිෂ්‍ය සමිතිය

**(ආ) එක් එක් පීඨ ශිෂ්‍ය සමිතියට තෝරා ගත යුතු නිලධාරීන්ගේ නිල නාමයන් සහ වෙනත් සාමාජික සංඛ්‍යාව**

(අ) සභාපති
(ආ) උප සභාපති
(ඇ) ලේකම්
(ඈ) සංස්කාරක
(ඉ) කණිෂ්ඨ භාණ්ඩාගාරික
(ඊ) වෙනත් සාමාජිකයන් 08 දෙනෙකු

(ඇ) 2010 අංක 01 දරන ශිෂ්‍ය සමිති අතුරු ව්‍යවස්ථාවෙහි 9 (1) වගන්තිය අනුව,

"පීඨයක සෑම අවසාන වසර ලියාපදිංචි උපාධි ශිෂ්‍යයෙකු හැර ලියාපදිංචි උපාධි අපේක්ෂක ශිෂ්‍යයෙක් ම පීඨ ශිෂ්‍ය සමිතියේ නිලධාරියෙකුගේ හෝ සාමාජිකයෙකුගේ නිලවරණය සඳහා අපේක්ෂකයකු වශයෙන් නම් කරනු ලැබීමට සුදුසුකම් දරයි."

01. **පීඨ ශිෂ්‍ය සමිති සඳහා නාමයෝජනා පත්‍ර භාරගන්නා දිනය හා වේලාව - 2022.10.26 දින පෙ.ව.9.00 සිට පෙ.ව.11.00 දක්වා**

02. **ස්ථානය**

| | | |
|---|---|---|
| සමාජීය විද්‍යා පීඨ ශිෂ්‍ය සමිතිය | - | සමාජීය විද්‍යා පීඨ කාර්යාලය |
| වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨ ශිෂ්‍ය සමිතිය | - | වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨ කාර්යාලය |
| විද්‍යා පීඨ ශිෂ්‍ය සමිතිය | - | විද්‍යා පීඨ කාර්යාලය |
| මානවශාස්ත්‍ර පීඨ ශිෂ්‍ය සමිතිය | - | මානවශාස්ත්‍ර පීඨ කාර්යාලය |
| වෛද්‍ය පීඨ ශිෂ්‍ය සමිතිය | - | වෛද්‍ය පීඨ කාර්යාලය |
| පරිගණක හා තාක්ෂණ පීඨ ශිෂ්‍ය සමිතිය | - | පරිගණක හා තාක්ෂණ පීඨ කාර්යාලය |

03. **විරෝධතා ඇතොත් 2022.10.26 දින පෙ.ව.11.00 සිට පෙ.ව.11.30 දක්වා ඉදිරිපත් කළ යුතුය.**

ලේඛකාධිකාරි,
කැලණිය විශ්වවිද්‍යාලය,
කැලණිය.

2022.10.13